# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 7 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය    කාලය : පැය 2

### I කොටස

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

1) ඕනෑම පුද්ගලයෙකු උපතත් සමඟ සාමාජිකත්වය ලබන්නේ,
   1. පාසල
   2. පවුල
   3. පන්සල
   4. පල්ලිය

2) සමාජය මඟින් වයෝවෘද්ධ පුද්ගලයන් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයකි.
   1. සුභසාධක අරමුදල් සැපයීම.
   2. වෘත්තිය සමිති පිහිටුවීම.
   3. පෝෂණ හා රැකවරය සැලසීම.
   4. වෘත්තීය පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

3) පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීමට පරීක්ෂා කරන්නේ,
   1. ඇඟිලි සලකුණු ය.
   2. D. N. A. ව්‍යුහයයි.
   3. බාහිර පෙනුමයි.
   4. අත්ලේ රේඛනයයි.

4) ඔබගේ පියාගේ අයියාගේ බිරිඳ ඔබේ නෑදෑකම,
   1. පුංචි අම්මා
   2. ආච්චි අම්මා
   3. ලොකු අම්මා
   4. ලොකු නැන්දා

5) ජන සමාජයේ පවතින හිතකර බලවේගයක් නොවන්නේ,
   1. පවුල
   2. වැරදි ජීවන රටා
   3. පාසලය
   4. කළණ මිතුරන් ය

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

6) දත්ත යනු කිසියම් විෂය ක්ෂේත්‍රයන් හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍රය. (     )
7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සේවකයන් ආරක්ෂා කිරීමට හා අයිතිවාසිකම් සුරැකීමට නීතියෙන් බැඳි තැන. (     )
8) සාප්පු හා කාර්‍යයාල පනතට අනුව වයස අවුරුදු 14ට අඩු දරුවන් සේවයේ යෙදවිය නොහැකිය. (     )
9) භාණ්ඩ වල මිල දර්ශකය වෙළඳසැල්වල ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය නොවේ. (     )
10) අමද්‍යප ව්‍යාපාරය සමාජයේ ප්‍රගමනයට හේතුවන ආයතනයකි. (     )

- 'අ' කොටසට ගැලපෙන ප්‍රකාශය 'ආ' කොටසින් තෝරා යා කරන්න.

| 'අ' | 'ආ' |
| --- | --- |
| 11) අධ්‍යාපනය ලැබීම. | මැර බලය භාවිතා නොකිරීම |
| 12) ජිවත් වීම. | හොඳින් ඉගෙනීම |
| 13) අදහස් ප්‍රකාශ කිරීම. | වෙනත් ආගම්වලට බාධා නොකිරීම |
| 14) කැමති ආගමක් ඇදහීම. | අන් අයට හිරිහැර නොකිරීම |
| 15) ඡන්දය ලබා ගැනීම. | අසමානතාවයෙන් සැලකීම |
| | අන් අයගේ සිත් නොරිදෙන ලෙස කතා කිරීම |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රකාශනවලට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත යොදන්න. (අභියෝග වලට / උචිත අරමුණු / ජීවිත සාර්ථකත්වය / නොඉවසිලිමත් බව / විභාග සමත්වීමට / ගුණගරුක බව)**

16) ආකර්ෂණීය දේවල් අතරින් ......................................... තෝරා ගැනීම ජීවිතයේ සාර්ථකත්වයට බලපාන සාධකයකි.

17) පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ......................................... ජීවිතයේ අරමුණක් විය යුතුය.

18) පුද්ගලයෙකු තුළ පවත්නා ......................................... ඔහු දුර්වල කරයි.

19) ආගමික ආයතන මඟින් අපේ ......................................... සඳහා ඉටු කරන මෙහෙය අතිමහත්‍ය.

20) ජිවත් වීම යනු ......................................... මුහුණ දීමය.

## II කොටස

- **ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

1)
   - i) න්‍යෂ්ටික පවුලක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 3)
   - ii) න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුල් ඒකකයක විශේෂත්වය කරුණු 4 කින් ලියන්න. (ල. 4)
   - iii) පවුලක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 5ක් ලියන්න. (ල. 5)

2)
   - i) සිරිත් මල්දමෙහි එන පහත කවිය සම්පූර්ණ කරන්න. (ල. 3)
     දෙගුරුන් ගුරුන් දුටු දෙවියන් ලෙස සිතමු
   - ii) ජන සමාජයේ පවත්නා හිතකර බලවේග 4ක් ලියන්න. (ල. 4)
   - iii) ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග 5ක් ලියන්න. (ල. 5)

3)
   - i) චිත්තවේග යනු කුමක්දැයි සරලව හඳුන්වන්න. (ල. 3)
   - ii) පුද්ගලයෙකු මුහුණපාන ප්‍රධාන චිත්තවේග 4ක් ලියන්න. (ල. 4)
   - iii) අයහපත් චිත්තවේග පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග සඳහා අදාහරණ 5ක් දෙන්න. (ල. 5)

4)
   - i) අයිතිවාසිකම් යනු කුමක්ද? (ල. 3)
   - ii) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් 4ක් ලියන්න. (ල. 4)
   - iii) ඔබ සහ ඔබේ පවුලේ සාමාජිකයන් අසල්වැසියන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථා 5ක් ලියන්න. (ල. 5)

5)

i) ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා 3ක් ලියන්න. (ල. 3)

ii) සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා සිදුවිය හැකි අවාසි 4ක් ලියන්න. (ල. 4)

iii) යහපත් පුරවැසියෙකු ලෙස ඔබ ප්‍රගුණ කළ යුතු ගුණාංග 5ක් ලියන්න. (ල. 5)

6)

i) අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට නම් ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 3ක් ලියන්න. (ල. 3)

ii) ඔබ වර්තමානයේ මුහුණපාන අභියෝග 4ක් ලියන්න. (ල. 4)

iii) අභියෝග ජය ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග 5ක් ලියන්න. (ල. 5)

7)

i) යුතුකමක් ලෙස හැඳින්වෙන්නේ කුමක්ද? (ල. 3)

ii) නීතිමය යුතුකමක් සාදාචාරාත්මක යුතුකමකින් වෙනස් වන්නේ කෙසේද? කරුණු 2කින් දක්වන්න. (ල. 4)

iii) වගකීමක් යනු කුමක්දැයි හඳුන්වා ඔබට පැවරී ඇති වගකීම් 2ක් ලියන්න. (ල. 5)